# පුරප්පාඩු දැන්වීමයි
## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සුදුසුකම් ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමට නියමිත තනතුරු**

| අනු අංකය | තනතුර | තනතුර අයත් සේවය හා ශ්‍රේණිය | සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අධීක්ෂණ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය I ශ්‍රේණිය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙක් විය යුතුයි | 01 |
| 02 | වෛද්‍ය අධිකාරී | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය I ශ්‍රේණිය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙක් විය යුතුයි | 03 |
| 03 | කාර්යය භාර වෛද්‍ය නිලධාරී | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය I / II ශ්‍රේණිය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I / II ශ්‍රේණියේ නිලධාරියෙක් විය යුතුයි | 04 |

**02. වෙනත් සුදුසුකම්**

I. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020(I) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03. බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අදාළ ශ්‍රේණි වලට අයත් අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටි අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**04. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද සියලුම අයදුම්පත් 2025.02.10 වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ ද නිර්දේශ සහිතව **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"......................... තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- එක් නිලධාරියෙකු තනතුරු එකකට වඩා වැඩි සංඛ්‍යාවකට අයදුම් කරන්නේ නම් තම අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍ර www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**05.** 2020.10.27 දිනැති අංක 2199/10 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි හා මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා 2013.01.01 දිනට අනුමත කාර්යය මණ්ඩල වාර්තාවේ සඳහන් කරුණු මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

**06.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්.ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2025 ජනවාරි මස 24 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය

## මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ
## අධීක්ෂණ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ
## ලකුණු නිර්ණායක

| | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨත්වය ලකුණු **30** | **01.** ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරියෙකු ලෙස I වන ශ්‍රේණියේ සම්පූර්ණ කර ඇති මුළු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | ලකුණු **30** |
| 02. කුසලතාවය ලකුණු **70** | **02.1.** කාර්යය සාධන ඇගයුම් (details below) | ලකුණු **15** |

**02.1.** <u>කාර්යය සාධන ඇගයුම්</u> — ලකුණු **15**

අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.
**(වසරකට ලකුණු 03 බැගින් වසර 05ක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)**

| | |
|---|---|
| 02.1.1. විශිෂ්ටයි | ලකුණු 03 |
| 02.1.2. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | ලකුණු 02 |
| 02.1.3. සතුටුදායකයි | ලකුණු 01 |

**02.2.** <u>අධ්‍යාපන සුදුසුකම්</u> — ලකුණු **10**

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, උසස් කිරීමේදී සළකා නොබැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | |
|---|---|
| 02.2.1. දර්ශනශූරී උපාධි (PhD) | ලකුණු 10 |
| 02.2.2. දර්ශනපති උපාධි ( M Phil) | ලකුණු 09 |
| 02.2.3. පශ්චාත් උපාධි | ලකුණු 08 |
| 02.2.4. පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ලකුණු 07 |

**(මෙහිදී ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)**

**02.3.** <u>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද</u> — ලකුණු **10**

ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරක වසර 10ක පළපුරුද්ද. ස්ථිර/වැඩ බලන කාලයද සළකා බැලේ. **(වසරක් සඳහා ලකුණු 01 බැගින් - උපරිම ලකුණු 10)**

**(සේවය කරන ලද කාලය සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)**

**02.4.** <u>විෂයය ක්ෂේත්‍රයට සම්බන්ධ දේශිය/විදේශිය පුහුණු පාඨමාලා</u> — ලකුණු **10**

02.4.1. මාස 03ට වැඩි - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 2.5 බැගින් - ලකුණු 10
02.4.2. සති 02 සිට මාස 03 දක්වා - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 08
02.4.3. සති 02ට අඩු - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 01 බැගින් - ලකුණු 04
**(උපරිම ලකුණු 10)**
**(අදාළ පුහුණු පාඨමාලා වල කාල සීමාව සනාථ කර තිබිය යුතුය)**

**02.5.** <u>ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති</u> — ලකුණු **10**

ක්‍රියාත්මක කරන ලද එක් ව්‍යාපෘතියකට - ලකුණු 5 බැගින් උපරිම ලකුණු 10
(උපරිම ව්‍යාපෘති 02ක් සඳහා)
**(ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)**

**02.6.** <u>ලබා ඇති ජයග්‍රහණ හා ප්‍රශංසාවන්</u> — ලකුණු **10**

02.6.1. පළාත්, ජාතික, අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ
(ලකුණු 03 බැගින් උපරිම 02ක් සඳහා ලකුණු 06)
02.6.2. ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ)
(ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04)
**(මේ සඳහා අදාළ වන ලේඛණ වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)**

**02.7.** <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය</u> — ලකුණු **05**

| | |
|---|---|
| නායකත්වය | ලකුණු 02 |
| සන්නිවේදන හැකියාව | ලකුණු 02 |
| පෞරුෂත්වය | ලකුණු 01 |

**මුළු ලකුණු — ලකුණු 100**

ඇමුණුම 02

<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>

<u>වෛද්‍ය අධිකාරී (ආයුර්වේද) තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ</u>

<u>ලකුණු නිර්ණායක</u>

| | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨත්වය **ලකුණු 30** | **01.** ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරියෙකු ලෙස I වන ශ්‍රේණියේ සම්පූර්ණ කර ඇති මුළු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | ලකුණු 30 |
| 02. කුසලතාවය **ලකුණු 70** | **<u>02.1. කාර්යය සාධන ඇගයුම්</u>** | ලකුණු 15 |

අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.
**(වසරකට ලකුණු 03 බැගින් වසර 05ක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)**

| | |
|---|---|
| 02.1.1. විශිෂ්ටයි | ලකුණු 03 |
| 02.1.2. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | ලකුණු 02 |
| 02.1.3. සතුටුදායකයි | ලකුණු 01 |

**<u>02.2. අධ්‍යාපන සුදුසුකම්</u>** — ලකුණු 08

රෝහල් කළමනාකරණය පිළිබඳව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, ශ්‍රේණි උසස් කිරීමේදී සළකා නොබැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | |
|---|---|
| 02.2.1. පශ්චාත් උපාධි | ලකුණු 08 |
| 02.2.2. පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ලකුණු 07 |

**(මෙහිදී ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)**

**<u>02.3. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද</u>** — ලකුණු 12

වෛද්‍ය අධිකාරී (ආයුර්වේද) තනතුරක වසර 03ක හෝ ඊට වැඩි කාලයක් වැඩ බැලීම්/රාජකාරී ඉටු කිරීම් **(උපරිම ලකුණු 12)**

| | |
|---|---|
| වැඩ බැලීම්/ රාජකාරී ඉටු කිරීම් | ලකුණු 04 බැගින් වසර 03ක් සඳහා |

**(සේවය කරන ලද කාලය සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)**

**<u>02.4. ආයතනික පරිපාලන විෂයය ක්ෂේත්‍රයට සම්බන්ධ දේශිය/විදේශිය පුහුණු පාඨමාලා</u>** — ලකුණු 10

02.4.1. මාස 03ට වැඩි - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 2.5 බැගින් - ලකුණු 10
02.4.2. සති 02 සිට මාස 03 දක්වා - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 08
02.4.3. සති 02ට අඩු - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 01 බැගින් - ලකුණු 04
**(උපරිම ලකුණු 10)**
**(අදාළ පුහුණු පාඨමාලා වල කාල සීමාව සනාථ කර තිබිය යුතුය)**

**<u>02.5. ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති</u>** — ලකුණු 10

ක්‍රියාත්මක කරන ලද එක් ව්‍යාපෘතියකට - ලකුණු 05 බැගින් උපරිම ලකුණු 10
(උපරිම ව්‍යාපෘති 02ක් සඳහා)
**(ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)**

**<u>02.6. ලබා ඇති ජයග්‍රහණ හා ප්‍රශංසාවන්</u>** — ලකුණු 10

02.6.1. පළාත්, ජාතික, අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ
(ලකුණු 03 බැගින් උපරිම 02ක් සඳහා ලකුණු 06)
02.6.2. ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ)
(ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04)
**(මේ සඳහා අදාළ වන ලේඛණ වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)**

**<u>02.7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය</u>** — ලකුණු 05

| | |
|---|---|
| නායකත්වය | ලකුණු 02 |
| සන්නිවේදන හැකියාව | ලකුණු 02 |
| පෞරුෂත්වය | ලකුණු 01 |

| | | |
|---|---|---|
| | මුළු ලකුණු | **ලකුණු 100** |

ඇමුණුම 03

## මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ
## කාර්ය භාර වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ
## ලකුණු නිර්ණායක

| | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨත්වය<br>ලකුණු 30 | **01.** ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරියෙකු ලෙස I හා II ශ්‍රේණි වල සම්පූර්ණ කර ඇති මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ජ්‍යෙෂ්ඨත්වය මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | ලකුණු<br>**30** |
| 02. කුසලතාවය<br>ලකුණු 70 | **02.1. කාර්යය සාධන ඇගයුම්**<br>අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>**(වසරකට ලකුණු 03 බැගින් වසර 05ක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)**<br>02.1.1. විශිෂ්ටයි — ලකුණු 03<br>02.1.2. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ — ලකුණු 02<br>02.1.3. සතුටුදායකයි — ලකුණු 01 | ලකුණු<br>**15** |
| | **02.2. අධ්‍යාපන සුදුසුකම්**<br>රෝහල් කළමනාකරණය පිළිබඳව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, ශ්‍රේණි උසස් කිරීමේදී සළකා නොබැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>02.2.1. පශ්චාත් උපාධි — ලකුණු 08<br>02.2.2. පශ්චාත් උපාධි ඩිප්ලෝමා — ලකුණු 07<br>**(මෙහිදී ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)** | ලකුණු<br>**08** |
| | **02.3. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද**<br>කාර්ය භාර වෛද්‍ය නිලධාරී තනතුරක වසර 03කට හෝ ඊට වැඩි කාලයක් වැඩ බැලීම/රාජකාරි ඉටු කිරීම **(උපරිම ලකුණු 12)**<br>වැඩ බැලීම්/ රාජකාරි ඉටු කිරීම — ලකුණු 04 බැගින් වසර 03ක් සඳහා<br>**(සේවය කරන ලද කාලය සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)** | ලකුණු<br>**12** |
| | **02.4. ආයතනික පරිපාලන විෂයය ක්ෂේත්‍රයට සම්බන්ධ දේශීය/විදේශීය පුහුණු පාඨමාලා**<br>02.4.1. මාස 03ට වැඩි - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 2.5 බැගින් - ලකුණු 10<br>02.4.2. සති 02 සිට මාස 03 දක්වා - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 08<br>02.4.3. සති 02ට අඩු - උපරිම සහතික 04ක් සඳහා ලකුණු 01 බැගින් - ලකුණු 04<br>**(උපරිම ලකුණු 10)**<br>**(අදාළ පුහුණු පාඨමාලා වල කාල සීමාව සනාථ කර තිබිය යුතුය)** | ලකුණු<br>**10** |
| | **02.5. ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති**<br>ක්‍රියාත්මක කරන ලද එක් ව්‍යාපෘතියකට - ලකුණු 05 බැගින් උපරිම ලකුණු 10<br>(උපරිම ව්‍යාපෘති 02ක් සඳහා)<br>**(ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය)** | ලකුණු<br>**10** |
| | **02.6. ලබා ඇති ජයග්‍රහණ හා ප්‍රශංසාවන්**<br>02.6.1. පළාත්, ජාතික, අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ<br>(ලකුණු 03 බැගින් උපරිම 02ක් සඳහා ලකුණු 06)<br>02.6.2. ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ)<br>(ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04)<br>**(මේ සඳහා අදාළ වන ලේඛණ වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)** | ලකුණු<br>**10** |
| | **02.7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය**<br>නායකත්වය — ලකුණු 02<br>සන්නිවේදන හැකියාව — ලකුණු 02<br>පෞරුෂත්වය — ලකුණු 01 | ලකුණු<br>**05** |
| | මුළු ලකුණු | ලකුණු<br>**100** |